# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානයේ
## පශ්චාද් උපාධි පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කිරීම

## 2019 අධ්‍යයන වර්ෂය

**මෙම විශ්වවිද්‍යාලය මගින් පහත දැක්වෙන පශ්චාද් උපාධි පාඨමාලා සඳහා 2018.12.21 දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.**

**01. බෞද්ධ අධ්‍යයන පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (PGD) (වර්ෂ එකයි)** (SLQF 08 - 25 Credits)

**අධ්‍යයන මාධ්‍යය** : සිංහල/ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තුව** : දේශීය සිසුන් සඳහා - රු. 21,750/-
විදේශීය සිසුන් සඳහා - US$ 405

**ලියාපදිංචිය සඳහා සුදුසුකම්**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් කවර හෝ විෂයධාරාවක් යටතේ වසර 03කට නොඅඩු උපාධි පාඨමාලාවක් සමත් ව තිබීම.
  හෝ
- ප්‍රාචීන අවසාන උපාධිය ලබා තිබීම.
  හෝ
- ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන යැයි විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

**02. එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (MA) (වර්ෂ එකයි)** (SLQF 09 - 30 Credits)

**අධ්‍යයන මාධ්‍යය** : සිංහල/ඉංග්‍රීසි

**අධ්‍යයන විෂය ධාරාව** : බෞද්ධ අධ්‍යයන/ සිංහල/ පාලි/ සංස්කෘත/ ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තුව** : දේශීය සිසුන් සඳහා - රු. 37,000/-
විදේශීය සිසුන් සඳහා - US$ 555

**ලියාපදිංචිය සඳහා සුදුසුකම්**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් කවර හෝ විෂයධාරාවක් යටතේ වසර 03කට නොඅඩු උපාධි පාඨමාලාවක් සමත් ව තිබීම.
  හෝ
- ප්‍රාචීන අවසාන උපාධිය ලබා තිබීම.
  හෝ
- ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන යැයි විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

**03. ශාස්ත්‍රපති දෑවුරුදු පර්යේෂණ උපාධි පාඨමාලාව (MA) (වර්ෂ දෙක යි)** (SLQF 10 - 60 Credits)

**අධ්‍යයන මාධ්‍යය** : සිංහල/ඉංග්‍රීසි

**අධ්‍යයන විෂය ධාරාව** : බෞද්ධ අධ්‍යයන/ සිංහල/ පාලි/ සංස්කෘත/ ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තුව** : දේශීය සිසුන් සඳහා - රු. 57,000/-
විදේශීය සිසුන් සඳහා - US$ 705

**ලියාපදිංචිය සඳහා සුදුසුකම්**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් කවර හෝ විෂයධාරාවක් යටතේ වසර 03කට නොඅඩු උපාධි පාඨමාලාවක් සමත් ව තිබීම.
  හෝ
- පිළිගත් විශ්වවිද්‍යාලයක එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධිය සමත් වීම.
  හෝ
- ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන යැයි විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මඟින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

**04. දර්ශනපති උපාධි පාඨමාලාව (MPhil) (වර්ෂ දෙක යි)** (SLQF 11)

| | | |
|---|---|---|
| **විෂය ධාරාව** | : | බෞද්ධ දර්ශනය/ බෞද්ධ සංස්කෘතිය/ බෞද්ධ ශිෂ්ටාචාරය/ බෞද්ධ අධ්‍යයනය/ සිංහල/ පාලි/ සංස්කෘත/ පුරාවිද්‍යාව/ සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය/ ඉංග්‍රීසි |
| **අධ්‍යයන මාධ්‍යය** | : | සිංහල/ඉංග්‍රීසි |
| **පාඨමාලා ගාස්තුව** | : | දේශීය සිසුන් සඳහා - රු. 64,000/- |
| | | විදේශීය සිසුන් සඳහා - US$ 1305 |

**ලියාපදිංචිය සඳහා සුදුසුකම්**

- ඉහත විෂයධාරාවන්ට අදාළ ව ප්‍රථම පන්ති, දෙවන පෙළ ඉහළ පන්ති සාමර්ථ්‍යයක් සහිත ව විශේෂ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම.
  හෝ
- පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉහත විෂයධාරාවන්ට අදාළ ව ශාස්ත්‍රපති එක් අවුරුදු උපාධි පාඨමාලාවකින් සමත් වීම.
  හෝ
- වෙනත් ඕනෑම විෂයධාරාවකින් ප්‍රථම පන්ති, දෙවන පෙළ ඉහළ පන්ති සාමර්ථ්‍යයක් සහිත ව විශේෂ ශාස්ත්‍රවේදී උපාධියක් හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අපේක්ෂකයෙකු ඉහත විෂයධාරාවන්ට අදාළව පශ්චාද් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම. (එහිදී පශ්චාද් උපාධි ඩිප්ලෝමාවට අදාළ විෂයධාරාවෙන් දර්ශනපති උපාධිය සඳහා ලියාපදිංචි විය හැකිය.)
  හෝ
- ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන යැයි විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මඟින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

**05. දර්ශනසූරී උපාධි පාඨමාලාව (PhD) (වර්ෂ තුන යි)** (SLQF 12)

| | | |
|---|---|---|
| **විෂය ධාරාව** | : | බෞද්ධ දර්ශනය/ බෞද්ධ සංස්කෘතිය/ බෞද්ධ ශිෂ්ටාචාරය/ බෞද්ධ අධ්‍යයනය/ සිංහල/ පාලි/ සංස්කෘත/ පුරාවිද්‍යාව/ සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය/ ඉංග්‍රීසි |
| **අධ්‍යයන මාධ්‍යය** | : | සිංහල/ඉංග්‍රීසි |
| **පාඨමාලා ගාස්තුව** | : | දේශීය සිසුන් සඳහා - රු. 79,000/- |
| | | විදේශීය සිසුන් සඳහා - US$ 1755 |

**ලියාපදිංචිය සඳහා සුදුසුකම්**

- ඉහත විෂයධාරාවන්ට අදාළ ව පිළිගත් විශ්වවිද්‍යාලයකින් වසර දෙකකට නොඅඩු පර්යේෂණ පශ්චාද් උපාධියක් ලබා තිබීම/ සාමාජීය විද්‍යාපති උපාධියක් (MSSc)/ දර්ශනපති උපාධියක් (MPhil) ලබා තිබීම.
  හෝ
- ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන යැයි විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මඟින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

අංක 05 සහ අංක 06 පාඨමාලා සඳහා අයදුම්කරුවන් ලියාපදිංචි කරනු ලබන්නේ අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන මාතෘකාවට අදාළ ප්‍රස්තුතීකරණය සහ ලියාපදිංචිය සඳහා සුදුසුකම් පරීක්ෂා කර බැලීමෙන් අනතුරුවය.

**අයදුම් කළ යුතු පිළිවෙල :**

**<u>අයදුම්පත් ගාස්තුව</u> :**

බෞද්ධ අධ්‍යයන පශ්චාද් උපාධි ඩිප්ලෝමා/ශාස්ත්‍රපති උපාධි (එක් අවුරුදු/දෑවුරුදු) - රු. 500/-

දර්ශනපති/දර්ශනසූරි උපාධි පාඨමාලා - රු. 1000/-

අයදුම්පත් දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින්, ගිණුම් අංක 711202 ට **'ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය'** නමින් අයදුම් කරනු ලබන පාඨමාලාවට අදාළ අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා ලබා ගන්නා ලදුපත විශ්වවිද්‍යාලයේ පහත සඳහන් ලිපිනයේ පිහිටි කාර්යාලය වෙත පැමිණ හෝ ලියාපදිංචි තැපැල් මගින් අයදුම්පත් ලබා ගත හැකි ය. තැපැල් මගින් අයදුම්පත් හා විස්තර ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් ඉහත ගිණුම් අංකයට අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා ලබා ගන්නා ලදුපත් සමග තම නම, ලිපිනය ලියන ලද 9''x4'' ප්‍රමාණයේ රු. 45/ක මුද්දර ඇලවූ කවරයක් ඉහත සඳහන් ලිපිනයට එවීමෙන් ලබා ගත හැකිය.

චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ. එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ පාඨමාලාවේ නම සඳහන් කර, **'අයදුම්පත්‍ර ලබා ගැනීම'** යනුවෙන් සඳහන් කළ යුතුය.

නියෝජ්‍ය ලේඛකාධිකාරී - වැඩබලන,
පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
අංක 214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

අන්තර්ජාලයේ www.bpu.ac.lk දරන විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් ද අයදුම්පත් ලබා ගත හැකි ය. එසේ ලබා ගන්නා අයදුම්පත් විශ්වවිද්‍යාලයට භාරදීමේ දී දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින්, ඉහත ගිණුම් අංකයට අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා ලබා ගන්නා ලදුපත සමග ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත්‍ර ගාස්තුව ගෙවීමේ දී අදාළ පාඨමාලාවේ කෙටි නාමය සඳහන් කළ යුතුය. (PGD/MA/MPhil/PhD)

**අයදුම්පත් නිකුත් කරන අවසාන දිනය : 2018.12.14**

නිවැරදි ව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2018.12.21** දිනට පෙර ඉහත ලිපිනයට යොමු කළ යුතුය.

වැඩි විස්තර සඳහා : 0112580609

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
නො. 214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

**2018.10.29**